# ශ්‍රී ලංකා නැව් සංස්ථාව
## වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

## ඇබෑර්තුව

පහත සඳහන් තනතුර පිරවීම සඳහා අදාල සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය හිමි අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්මික අධිකාරි තනතුර – කොන්ත්‍රාත් පදනම (ඇබෑර්තු 01)

| | |
|---|---|
| **සුදුසුකම් :** | **ශ්‍රී ලංකාව, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, චීනය, ඉන්දියාව, පාකිස්ථානය, නවසීලන්තය, මැලේසියාව, සිංගප්පූරුව, දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය හෝ අදාළ සහතිකපත් පිළිගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ ද්විපාර්ශ්වික ගිවිසුමකට ඇතුළත් වී ඇති වෙනත් රටක රාජ්‍ය නැව් කටයුතු පරිපාලන ආයතනයක් විසින් නිකුත් කළ ප්‍රධාන ඉංජිනේරු ප්‍රවීණතා සහතිකය ලබාගෙන තිබීම.** |
| | සහ |
| | කිලෝවොට් 3000කට වැඩි ධාරිතාවක ප්‍රධාන එන්ජිම සහිත සමුද්‍රගාමී වෙළඳ නැවක ප්‍රධාන ඉංජිනේරුවරයෙකු ලෙස අවම වශයෙන් වසර 2ක සේවා පළපුරුද්දක් තිබීම. |
| | සහ |
| | නැව් තනන ස්ථානයක හෝ නැව් කටයුතු සමාගමක අලුත්වැඩියා කළමනාකාරීත්වය පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම. |
| **වැටුප්:** | මාසික දීමනාව රු .437, 500 / - වන අතර, මීට අමතරව රජයේ අනුමත මාසික වාහන දීමනාව සහ ඉන්ධන දීමනාව ගෙවනු ලැබේ. |
| **වයස් සීමාව :** | අවුරුදු 35 වැඩි විය යුතුයි. |
| **බඳවා ගැනීමේ ක්‍රමවේදය :** | පත්කිරීම් බලධරයා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

**ඊකියා විස්තරය**

- සමාගමේ ආරක්ෂාව සහ තත්ව සංග්‍රහය තුළ දක්වා ඇති ක්‍රියාපටිපාටි සහ කළමනාකාරීත්වය විසින් නිකුත් කරනු ලබන අනිකුත් උපදෙස් ක්‍රියාත්මක කිරීම.
- නියම කරන ලද යාත්‍රාවල ව්‍යවස්ථාපිත සහ පන්ති අවශ්‍යතාවයන් නියාමනය කිරීම හා ඒවාට අනුකූල වන බව සහතික කිරීම.
- තත්ත්ව අවශ්‍යතාවන් පූර්ණ ලෙස සැපිරීම පිණිස නාවික කළමනාකරණ කණ්ඩායම සමග එක්ව නියම කළ යාත්‍රාවන්ගේ කාර්ය සාධනය සහ තත්වය කළමනාකරණය කිරීම.
- අර්ධ වාර්ෂික යාත්‍රා පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය පරිදි පසු විපරම් කිරීම, පරීක්ෂණ වාර්තා අඩුපාඩු, අභ්‍යන්තර වාර්තා සහ අදාළ දෙපාර්තමේන්තු වලින් නිරීක්ෂණ වාර්තා අනුව නිවැරදි කිරීම් කිරීම.
- සැලැසුම්කළ නඩත්තු පද්ධතිය හරහා යාත්‍රාවල විධිමත් නඩත්තුව නියාමනය කිරීම වැඩ සහ වාර්තා යාවත්කාලීන කර ඇති බවට සහතිකවීම.
- වැඩිදියුණු කිරීම් සහ වෙනස්කිරීම් කළයුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ යාත්‍රාවල ඵලදායී මෙහෙයුම් සඳහා නිර්දේශ සිදු කිරීම.
- ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ සමාගමේ ප්‍රමිතිවලට අනුකූලවීම සඳහා සියලුම අමතර කොටස් අලුත්වැඩියා කිරීම් වෙනස් කිරීම් සහ සේවාවන් සූදානම් කිරීම.
- වියළි තටාක සැලසුම් කිරීම හා එයට මැදිහත්වීම මෙන්ම පවරන ලද යාත්‍රාවල අලුත්වැඩියාකිරීම්අධීක්ෂණය වෙනස් කිරීම් සහ , මකිරී
- පවරන ලද යාත්‍රාවල නැවක අළුත්වැඩියා /වෙනස්කිරීම් කටයුතුවල යෙදී සිටින සියලුම තෙවන පාර්ශව විසින් සෞඛ්‍ය, ආරක්ෂාව හා පරිසරය සුරැකීම සම්බන්ධයෙන් සමාගමේ ප්‍රතිපත්තිවලට අනුකූල බව සහතික කිරිම සඳහා නැවේ සිටින කලමනාකාරීත්වය සමග කටයුතු කිරීම.
- වගකීම් දෝෂ සම්පව නියාමනය කිරීම සහ අලුත් වැඩියාවන් අවසන් කරන බවට සහතික වීම.
- ධාවන වියදම් අයවැය සංවර්ධනය කිරීම ,අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම.
- තත්ව කලමනාකාරීත්ව පද්ධතිය වැඩි දියුණු කිරීමට සෘජු දායකත්වය ලබාදීම සහ දෙපාර්තමේන්තු ක්‍රියාපටිපාටි අඛණ්ඩ අඛණ්ඩව වැඩි දියුණු කිරීම ට කටයුතු කිරීම.
- සිද්ධි විමර්ශණ කණ්ඩායමේ පාර්ශවයක් ලෙස විමර්ශණයන්ට සහාය ලබා දීම.

**ප්‍රතිලාභ**

1. සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්වය
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු ආවරණය
4. සන්නිවේදන වියදම් ප්‍රතිපූරණය

**<u>පොදු උපදෙස්</u>**

- සියලුම අයදුම්පත් තමා විසින් සත්‍ය බවට සහතික කළ අධ්‍යාපන වෘත්තීය සහතිකපත්වල / පිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපෑලෙන් සභාපති, MICH ගොඩනැගිල්ල, සර් රසීක් ෆරීඩ් මාවත, කොළඹ 01 වෙත හෝ** [chairman@cscl.lk](mailto:chairman@cscl.lk) **යන විද්‍යුත් තැපෑලට** මෙම දැන්වීමේ සිට දින 07ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත එවන ලිපිකවරයේ වම්පස කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. ඕනෑම ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

---

**සභාපති**

**සීමාසහිත ලංකා නැව් සංස්ථාව,**

**අංක ,27MICH ගොඩනැගිල්ල,**

**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත බ්‍රිස්ටල් වීදිය,**

**කොළඹ 01**

දිනය : 2026.08.25